# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1868/57 - 2014 ජුනි මස 25 වැනි බදාදා - 2014.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : අත්/කේඩී/129/එච්ඩබ්ලිව්.

කොළඹ පිටත පිටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය සඳහා අතිරේක ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේ පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 494/ඒ හෝකන්දර නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හෝකන්දර ගමේ පිහිටි, මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරේ අංක කො. 9309හි සහ 2014.06.11 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4102 ක් පමණ වූ කැබලි අංක 1 සිට කැබලි අංක 6 දක්වා පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි.

1. කැබලි අංකය 1

ඉඩමේ නම: ඉදිගහවෙල කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: දීපානි මුදන්නායක, අංක 43, නොරිස් කැනල් මාවත, කොළඹ 10; ප්‍රමාණය: හෙක්. 0.1613.

2. කැබලි අංකය 2

ඉඩමේ නම: ඉදිගහවෙල කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: මාලබේ සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0175.

3. කැබලි අංකය 3

ඉඩමේ නම: ඉදිගහවෙල කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: වාල්ස් පෙරේරා, සුහද මාවත, හොරහේන; ප්‍රමාණය: හෙක්. 0.0045.

4. කැබලි අංකය 4

ඉඩමේ නම: ඉදිගහවෙල කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්ලිව්. පී. සෝමසිරි ජයලත් පෙරේරා, අංක 30, හොරහේන පාර, හෝකන්දර; ප්‍රමාණය: හෙක්. 0.0816.

5. කැබලි අංකය 5

ඉඩමේ නම: ඉදිගහවෙල කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්. පී. පුෂ්පා රංජනී, අංක 311/4, කනත්ත පාර, පෝරේ, අතුරිගිරිය; ප්‍රමාණය: හෙක්. 0.1245.

6. කැබලි අංකය 6

ඉඩමේ නම: ඉදිගහවෙල කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්ලිව්. පී. බබානෝනා, සුහද මාවත, හොරහේන; ප්‍රමාණය: හෙක්. 0.0208.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 ජූලි මස 23 වැනි දින පෙ. ව. 10.00 ට, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2014 ජූලි මස 16 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩබ්. එම්. දයාවතී,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2014 ජුනි මස 23 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 311


1A - G 19790 - 15 - (2014/06)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.